**ශීර්ෂය 292 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතුශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 මැයි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

--------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන් ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මෙම වාර්තාවේ 1.6.1 (ආ)i ඡේදයෙහි ඇතුළත් නිරීක්ෂණ අනුව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප නොවූ බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූලධන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූලධන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූලධන වැය විෂයයන් දෙකක දෙපාර්තමේන්තු පොත් අනුව මුළු වියදම හා භාණ්ඩාගාර පොත් අනුව මුළු වියදම අතර රු.2,097,360 ක වෙනසක් පැවතුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනස්කම් හඳුනාගෙන ගිණුම්වලට අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතු වීම. |
| (ආ) | දෙපාර්තමේන්තු පොත් අනුව 292-2-3-17-2507 වැය විෂයයේ ඉතිරියක් නොමැති වුවද භාණ්ඩාගාර පොත් අනුව රු.284,081 ක ඉතිරියක් පැවතුණි. | -එම- | වෙනස්කම් හඳුනාගෙන ගිණුම්වලට අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතු වීම. |

### 1.6.2 දේපළ පිරියත හා උපකරණ

දේපළ පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් ශේෂ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් කිරීමේදී ප්‍රධාන ලෙජර් වියදම් 3 ක ශේෂ හා මූල්‍ය නොවන වත්කම් විෂයයන් 10 ක ශේෂවල රු.129,262,877 ක වෙනස්කම් පැවති අතර එම වෙනස්කම්වලට හේතු මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | වෙනස්වීම්වලට හේතු හඳුනාගෙන නිවැරදිව ගිණුම්වලට ගැලපීම් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය අනුව දේපල පිරියත හා උපකරණවල වටිනාකම රු.2,592,330,789 ක් වූ නමුත් SA - 82 භාණ්ඩාගාර පොත් අනුව එය රු.2,507,277,259 ක් වූයෙන් රු.85,053,530 ක නොසැසඳීමක් විය. | නිවැරදි කරන ලෙස මහා භාණ්ඩාගාරය වෙත ලිඛිතව දැනුම් දී ඇති බව. | වෙනස්වීම්වලට හේතු හඳුනාගෙන නිවැරදිව ගිණුම්වලට ගැලපීම් කළ යුතු වීම. |
| (ඇ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි මිලදී ගැනීම්වල එකතුව රු.112,977,257 ක් වුවද අංක 2102, 2103, 2104 හා 2105 වැය විෂයයන් යටතේ මිලදී ගැනීම් වටිනාකම රු.2,947,881 ක් වූ බැවින් රු.110,029,376 ක නොසැසඳීමක් විය. | පිළිගන්නා බව. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්වලට ගැලපීම් කළ යුතු වීම. |

**1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

---------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන විධිමත්ව පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශනයට පත්කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති ප්‍රකාරව පවත්වා ගත යුතු පහත සඳහන් ලේඛන පවත්වා නොතිබුණි.<br><br>(i) පත්කිරීම් හා උසස්කිරීම්<br>(ii) සේවයෙන් පහකළ නිලධාරීන්<br>(iii) සේවයෙන් ඉල්ලා අස්වූ නිලධාරීන්<br>(iv) තනතුර අතහැර ගිය නිලධාරීන්<br>(v) වැඩ තහනම්කර ඇති නිලධාරීන්<br>(vi) විශ්‍රාම ගන්වනු ලැබූ නිලධාරීන් | විෂයය භාර නිලධාරීන් විසින් යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාමට කටයුතු කරමින් පවතින බව. | අදාළ ලේඛන යාවත්කාලීනව පවත්වාගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වාර්ෂික අයවැය ලේඛනය මගින් ශීර්ෂ අංක 292 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු. 1,253,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද ඒ සඳහා නිදහස් කර තිබුණේ රු.1,147,730,718 ක අග්‍රිම මුදල් පමණක් බැවින් රු.105,269,282 ක වෙනසක් පැවතුණි. මේ අනුව ප්‍රමාණවත් මුදල් නොලැබීම නිසා වැය විෂයයන් 3 ක රු.27,014,231 ක ප්‍රතිපාදන ඉතිරිවීම් නිරීක්ෂණය විය. | පිළිගන්නා බවත් අක් මුදල් ලබාගැනීමට නොහැකි වීම මත වැය විෂයයන්වල ඉතිරිවීම් සිදුව තිබෙන බව. | ලැබී තිබෙන අග්‍රිම මුදල් වලින් උපරිම ප්‍රයෝජන ලබාගත යුතුවීම. |

### 2.2 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව විසින් ආදායම් ශීර්ෂ 5 ක් යටතේ ඇස්තමේන්තු සකස් කර ආදායම් රැස්කර තිබුණු අතර ආදායම් රැස්කිරීම ඇස්තමේන්තු ගත ආදායමෙන් සියයට 04 සිට සියයට 149 දක්වා පරාසයක පැවතුණි. ඒ අනුව ආදායම් තක්සේරු කිරීම ප්‍රායෝගික, තාත්වික භාවයෙන් තොරව සිදු කර තිබුණි. | පිළිගන්නා බවත් එම වෙනස්කම් ඉදිරියේදී අවම කර ගැනීමට කටයුතු කරන බව. | පූර්ව දත්ත පදනම් කරගෙන හැකිතාක් තාත්වික හා නිවැරදිව ඇස්තමේන්තු සකස් කළ යුතු වීම. |

### 2.3. වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වැය විෂයයන් 18 ක් සඳහා වෙන්කර තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.115,682,791 ක් උපයෝජනය නොකර ඉතිරිකර තිබුණු අතර එම ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 16 සිට සියයට 90 දක්වා පරාසයක පැවතුණි. | පිළිගන්නා බව. | තාත්විකව හා නිවැරදිව ඇස්තමේන්තු සකස් කළ යුතු වීම. |

## 2.4 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තු පොත් අනුව වැය විෂයයන් 05 ක 2020 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු බිල්පත් වටිනාකම රු.5,643,357 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයෙහි (සටහන III) එය රු.4,230,771 ක් ලෙස රු.1,412,586 ක් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගන්නා බවත් ඉදිරියේදී මෙම ගැටළුව අවම කර ගැනීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුවීම. |

## 2.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරීන් විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | දෙපාර්තමේන්තුවේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික වියයුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳ කලින් කල සමාලෝචනය කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |

**2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | නිරීක්ෂණය<br>අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| i. XII පරිච්ඡේදයේ 1.2 , 1.3 සහ 22 වගන්ති | නිවාඩු ලබාගැනීමට පෙර අනුමත කරගත යුතු නමුත් සීප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාලයේ සේවය කරන නිලධාරියෙකු නිවාඩු අනුමත කරගැනීමකින් තොරව 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළදී දින 306 ක් වැටුප් රහිත නිවාඩු ලබාගෙන තිබුණි. | . ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට නිලධාරීන්ට උපදෙස් ලබාදුන් බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. |
| ii. XXVIII පරිච්ඡේදයේ 1.3 වගන්තිය | නිලධාරීන් 13 දෙනෙකු විසින් දින 31 කදී පැමිණීම හා පිටවීම අත්සන් කර නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට නිලධාරීන්ට උපදෙස් ලබාදුන් බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| මුදල් රෙගුලාසි 155 | 2017 වර්ෂයේ සිට වසර 03 ක් තුළ නිකුත් කළ විගණන විමසුම් සඳහා දින 48 සිට දින 196 දක්වා ප්‍රමාද වී පිළිතුරු සපයා තිබුණි. | -එම- | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සිප්පුකුලම හා කරදගොල්ල සත්ත්ව පාලන විද්‍යාලවල ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා පසුගිය අධ්‍යයන වර්ෂ 4 කදී අයදුම්පත් 483 සිට 693 දක්වා වූ ප්‍රමාණයක් ලැබී තිබුණද විද්‍යාලවල පාඨමාලා සඳහා සිසුන් 90 සිට 144 දක්වා හෙවත් සියයට 36 සිට සියයට 76 දක්වා අඩු සිසුන් සංඛ්‍යාවක් තෝරාගෙන තිබුණි. ප්‍රමාණවත් පරිදි සිසුන් ඇතුළත් කිරීමට අවධානය යොමුකර ජාතික අවශ්‍යතාවය සඳහා ඩිප්ලෝමාධාරීන් බිහි කිරීමට කටයුතු නොකිරීම නිසා සත්ත්ව පාලන විද්‍යාල සතුව තිබෙන ඉඩම් සහ ගොඩනැගිලි ඌන උපයෝජිතව තත්ත්වයේ පැවතුණි. සිප්පුකුලම විද්‍යාලයේ පමණක් ඉඩම් අක්කර 129 ක්ද ගොඩනැගිලි වර්ග 21 ක්ද තිබුණු නමුත් ප්‍රමාණවත් ජල පහසුකම් හා මානව සම්පත් නොතිබීම මෙම තත්ත්වයට හේතු වී තිබුණි. | පිළිගන්නා බවත් දුෂ්කර හා ජල පහසුව අවම ප්‍රදේශයක පිහිටි සිප්පුකුලම සත්ත්ව පාලන භූමිය නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් මානව සම්පත් හා මූල්‍ය සම්පත් නොමැති කම මෙම භූමිය සංවර්ධනයට බලපා ඇති ප්‍රධාන ගැටළුව බව. | දැනට තිබෙන සම්පත් උපරිම අයුරින් උපයෝජනය කළ යුතු වීම. |
| (ආ) | සත්ත්ව රෝග මර්ධන වැඩසටහන යටතේ එන්නත් කරනු ලබන්නේ සමස්ත ගව ගහනය පදනම් කරගෙන නොව රෝග අවදානම් ගහනය පදනම් කරගෙන වුවද, රෝග අවදානම් ප්‍රදේශ හා පළාත් කාර්යාලවලින් ලබාදෙන තොරතුරු පදනම් කරගෙන ඉලක්කයන් සකස් කළද රෝගය මර්ධනය කිරීම සඳහා උපාය මාර්ගික සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | නීති විරෝධි අයුරින් සෞඛ්‍ය සහතික නොමැතිව රාජ්‍ය නොවන ආයතන හා පුන්‍ය ආයතන සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේඋපදේශකත්වය නොමැතිව හා කිසිදු දැනුම්දීමකින් තොරව රෝගී සතුන් පිං පිණිස බෙදා හැරීම නිසා රෝග ව්‍යාප්තිය වැඩිවන බව. | උපායමාර්ගික සැලැස්මක් පිළියෙල කළයුතු වීම. |

### 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පශු සම්පත් අභිජනන ව්‍යාපෘතිය යටතේ DF සීමන් වඩි 3,500 ක් සහ පට්ටි හරක් 20 ක් ආනයනය කිරීමට සැලැසුම් කර තිබුණු නමුත් එම කාර්යයන් ඉටු කර නොතිබුණි. | DF ගව ශුක්‍ර වඩි ආනයනය කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකර ටෙන්ඩරය පිරිනමන ලද අතර අදාළ සැපයුම්කරු විසින් ගවශුක්‍ර වඩි මෙතෙක් ලබාදී නොමැති බව හා පට්ටි හරක් ගෝලීය වසංගතය හේතුවෙන් ආනයන කිරීම සීමා කිරීම හේතුවෙන් සතුන් ආනයනය කිරීමට නොහැකි වූ බව. | සැලැසුම් කළ කාර්යය භාරයන් ඉටු කළයුතු වීම. |

### 3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සීමන් වඩි 325000 ක් දේශීයව නිපදවීමට සැලැසුම් කර තිබුණද නිෂ්පාදනය කර තිබුණේ වඩි 218,835 ක් හෙවත් සියයට 67 ක් පමණකි. | පිළිගන්නා බවත් රටතුළ පවතින කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් සැලැසුම් කළ පරිදි වාර්ෂික භෞතික ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වූ බව. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මෙහි සඳහන් ඉලක්කයන් ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුවීම. |
| (ආ) එන්නත් 400000 ක් මිලදී ගැනීමට සැලැසුම් කර තිබූ නමුත් මිලදි ගෙන තිබුණේ එන්නත් 225000 ක් හෙවත් සියයට 56 ක් පමණකි. | -එම- | -එම- |
| (ඇ) කුකුළන් සඳහා ක්ෂේත්‍ර මට්ටමේ එන්නත් 5916400 ක් ලබාදීමට සැලැසුම් කර තිබුණද එන්නත් 3494271 ක් හෙවත් සියයට 59 ක් පමණක් ලබාදී තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සතුන් 140000 ක කන් සලකුණු කිරීමට සැලැසුම් කර තිබු නමුත් සලකුණු කර තිබුණේ සතුන් 81025 ක් පමණි. | -එම- | -එම- |
| (ඉ) | නිෂ්පාදනය කිරීමට සැලැසුම් කරන ලද FMD එන්නත්වලින් සියයට 10 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි. | පිළිගන්නා බවත් එන්නත් නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය 2020 වර්ෂයේදී අපේක්ෂිත ලෙස ලබාගැනීමට නොහැකි වූ බව. | -එම- |

## 3.4 **වයාපෘති නිම නොකර අත්හැර දැමීම**

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොල්ගොල්ල සත්ත්ව විෂාණු රසායනාගාරය ඇස්තමේන්තුගත වටිනාකම රු.3,273,873 ක් වූ වැඩ විෂයයන් 95 ක් යටතේ වැඩිදියුණු කිරීම හා අලුත්වැඩියා කිරීම සඳහා තෝරාගත් කොන්ත්‍රාත් ආයතනයක් සමඟ 2018 අගෝස්තු 31 දින ගිවිසුමකට එළඹ තිබුණු අතර 2018 දෙසැම්බර් 29 දිනට කාර්යයන් නිමකර භාරදිය යුතු ව තිබුණි. එහෙත් එදින සිට 2020 අගෝස්තු 11 දින වන විට මාස 19 ක් ගතවී ඇතත් වැඩ නිම නොකිරීම නිසා ගිවිසුම අවලංගු කර තිබුණි. වැඩ විෂයයන් 95 න් 10 ක් සම්පූර්ණයෙන්මද 06 ක් අර්ධ වශයෙන්ද නිම කර තිබුණු නමුත් ඇස්තමේන්තුගත වටිනාකම රු.2,262,204 ක් වූ වැඩ විෂයයන් 78 ක කටයුතු ඉටුකර නොතිබුණි. | ගිවිසුමෙහි සඳහන් දිනට වැඩ නිම කර භාර නොදීම හේතුවෙන් ගිවිසුම අවලංගු කළ බව. | ලැබෙන ප්‍රතිපාදන මඟින් මහජනයාට උපරිම සේවයක් සැලසෙන පරිදි වයාපෘති නිම කිරීමට කටයුතු කළ යුතු වීම. |

**3.5** **මුදල් නිදහස්කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

-----------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1.(ඇ) මාර්ගෝපදේශයේ නියමයන්ගෙන් බැහැරව ප්‍රතිපාදන වෙන් කර ගැනීමකින් තොරව ඇස්තමේන්තුගත වටිනාකම රු.165,831,215 ක් වූ ගොඩනැගිලි ඉදිකිරීම් 3 කට අදාළ ව්‍යුහාත්මක හා වාස්තු විද්‍යාත්මක සැලැසුම් සකස් කිරීම සඳහා 2018 වර්ෂයේ දී ආයතනයකට රු.1,602,094 ක් ගෙවා තිබුණු නමුත් 2020 දෙසැම්බර් 31 වන විටත් එයින් කිසිදු ඉදිකිරීමක් ආරම්භ කර නොතිබුණි. | පිළිගන්නා බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුවීම හා ප්‍රතිපාදන ඵලදායිව උපයෝජනය කර ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතු වීම. |
| (ආ) | ත්‍රිකුණාමලය පශු වෛද්‍ය කාර්යාලය ඉදිකිරීම සඳහා තෝරාගත් කොන්ත්‍රාත්කරුවෙකු සමඟ 2016 අගෝස්තු 09 දින ගිවිසුමකට එළඹ තිබුණු අතර ගිවිසුම අනුව රු.12,182,590 ක මුදලකට 2016 දෙසැම්බර් 07 දින වැඩ නිමකර භාරදිය යුතුව තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් කරන ලද ඉල්ලීම් පිළිගෙන අවස්ථා 03 කදී 2018 මාර්තු 31 දින දක්වා කාලය දීර්ඝ කර තිබුණු නමුත් එදිනටද ඉටුකර තිබුණේ සැලැසුම් ගත කාර්යයන්වලින් අර්ධයක් හෙවත් රු.6,996,885 ක වැඩ පමණි. එබැවින් 2018 ජුනි 18 දින ගිවිසුම අවසන් කර තෝරාගත් නව කොන්ත්‍රාත්කරුවෙකුට කාර්යය පවරා තිබුණි. | නියමිත කාලයට වඩා අවුරුදු 01 මාස 05 ක කාලයක් ලබාදී තිබුණද එම කාලය තුළදීද මෙම කාර්යය ඉටු කිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වීම හේතුවෙන් මෙම කොන්ත්‍රාත්තුව අවලංගු කළ බව. | ඇස්තමේන්තුව හා නියමිත පිරිවිතරයන්ට අනුව අරමුණු ඉටු වන පරිදි ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතු වීම. |

## 3.6 වාර්ෂික කාර්යයසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් පරිදි වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙළ කළ යුතුව තිබුණි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය අනුව කාර්යය සාධන වාර්තාව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පිළිගන්නා බවත් ඉදිරියේදී විගණනයට ඉදිරිපත් කරන බව. | චක්‍රලේඛ උපදෙස් හා ව්‍යවස්ථාපිත විධිවිධාන අනුව කටයුතු කළයුතු වීම. |

## 3.7 ප්‍රසම්පාදනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2020 ඔක්තෝබර් 12 දින අංක 255 දරන මුඛ හා කුර රෝග සඳහා භාවිතා කරන එන්නත් 100,000 ක් මිලදී ගැනීම සඳහා රු.8,200,000 ක් වැයකර තිබුණි. එහිදී, | | |
| (i) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 මාර්ගෝපදේශය බැහැරව මිලදී ගැනීමට අපේක්ෂා කරන එන්නත් තොග ප්‍රමාණය ලංසු කැඳවීමේ පුවත්පත් දැන්වීමේ සඳහන් කර නොතිබුණි. | පිළිගන්නා බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතුවීම. |
| (ii) | එක් සැපයුම් ආයතනයකින් පමණක් එක් වඩියක් රු.82 බැගින් ලංසු ලැබී තිබුණි. | පිළිගන්නා බව. | -එම- |
| (iii) | තාක්ෂණික ඇගැයීම් කමිටුව වාර්තාවේ සැපයුම්කරු අනෙකුත් කොන්දේසි සපුරා තිබෙන නමුත් ඉදිරිපත් කර තිබෙන මිල 2018 සහ 2019 වර්ෂවල සැපයූ මිල ගණන් හා සැසඳීමේ දී පිළිවෙලින් සියයට 136 ක් සහ සියයට 73.51 ක් වැඩි බව දක්වා තිබුණි. | හදිසි අවශ්‍යතාවයක් ලෙස සලකා මිලදී ගැනීම් සිදු කර ඇති බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (iv) | 2020 වර්ෂයේදී නැවත එන්නත් වඩි 300,000 ක් මිල දී ගැනීම සඳහා 2020 අගොස්තු 17 දින මිල කැඳවීමේදී එම එන්නත් එක වඩියක් රු.42.05 කට සැපයීමට සැපයුම්කරුවෙකු ඉදිරිපත් වී තිබුණි. | පිළිගන්නා බව. | -එම- |
| (v) | ප්‍රසම්පාදන මාර්ගොපදේශ සංග්‍රහයේ 7.12 මාර්ගෝපදේශයේ නියමයන්ගෙන් බැහැරව ඵලදායී තරඟකාරී බවක් නොමැති බව පැහැදිලිව පෙනෙන විට ලැබුණු ලංසු ප්‍රතික්ෂේප කිරීම, ලැබී තිබුණු ලංසුව වෙළඳපොල මිල ගණන් සමඟ සැසඳීම, ලැබී ඇති එකම මිල අධික නම්, ලංසු මිල අඩු කර ගැනීම සඳහා ලංසු කරු සමඟ සාකච්ඡා කිරීම සිදු කර නොතිබුණි. ඒ අනුව 2020 අගෝස්තු 17 දින මිල කැඳවීමේදී ලැබී තිබුණු රු. 42.05 ලංසුව සමඟ සැසඳීමේදී 2020 ඔක්තෝබර් 12 දින අංක 255 දරන වවුචරයෙන් එකක් රු.82 බැගින් ගෙවා මිලදී ගන්නා ලද එන්නත් වඩි 100,000 සඳහා රු.3,995,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. | පිළිගන්නා බව. | -එම- |
| (ආ) | දියර නයිට්‍රජන් 2019 වර්ෂයේදී ලීටර් 261,704 ක් ද 2020 පෙබරවාරි දක්වා ලීටර් 41,404 ක් ද වශයෙන් ලීටර් 303,108 ක් එක ලීටරයකට රු.74 බැගින් රු.22,429,992 ක් ගෙවා මිලදී ගෙන තිබුණි. | | . |
| (i) | 2019 වර්ෂයේදී මිලගණන් කැඳවීමේ දී දෙදෙනෙකු විසින් රු.62 සහ රු.74 වශයෙන් මිල ගණන් අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.19 (අ) මාර්ගෝපදේශය අනුව අවම මිල තෝරා නොගැනීම හේතුවෙන් රු.3,140,448 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | ටෙන්ඩර් පිරිවිතර සියල්ලටම කොන්දේසි විරහිතව එකගවී තිබීම හේතුවෙන් වැඩි මිල සහිත සැපයුම්කරු තෝරාගත් බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුවීම. |
| (ii) | තම ආයතනය ඉරිදා සහ වෙළඳ නිවාඩු දිනයන්හි වසා තබන අතර එම දිනයන්හිදී මිලදී ගන්නේ නම් රු.3000 ක අමතර මුදලක් අයකර ගන්නා බවට අවම මිල වූ රු.62 ඉදිරිපත් කල සැපයුම්කරු විසින් කොන්දේසියක් පනවා තිබීම තාක්ෂණික | පිළිගන්නා බව | -එම- |

| | | | |
|---|---|---|---|
| | ඇගයීම් කමිටුව විසින් එම සැපයුම්කරු ප්‍රතික්ෂේප කිරීමට ප්‍රධානතම හේතුව වී තිබුණි. ලීටර් එකක් සඳහා රු.62 බැගින් ලීටර් 261,704 ක් රු.16,225,648 ක වටිනාකමකට මිලදී ගැනීමෙන් සහ 2019 වර්ෂයේ ප්‍රසිද්ධ සහ වෙළඳ නිවාඩු දිනයන් 28 පැවති බැවින් එක දිනකට රු.3,000 බැගින් රු.84,000 ක් අතිරේකව ගෙවීමෙන් වුවද වැය වන්නේ රු.16,309,648 ක් පමණකි. එබැවින් අවම මිල ඉදිරිපත් කල සැපයුම්කරුගේ මෙම කොන්දේසිය යටතේ මිල දී ගනු ලැබුයේ වුවද දෙපාර්තමේන්තුවට රු.3,056,448 ක මුදලක් ඉතිරි කර ගත හැකිව තිබුණි. | | |
| (iii) | අවම මිල සැපයුම්කරු විසින් තමන්ගේ ලංසුව ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවට ද සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශයේ ලේකම් ට ද පැමිණිලි කර තිබූ අතර ඒ සම්බන්ධයෙන් එම ආයතන විසින් කරන ලද විමසීම් වලට දෙපාර්තමේන්තුව දක්වන ලද ප්‍රතිචාර තහවුරු නොවීය. | දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දෙදෙනෙකු සහභාගි වී තිබුණද එම රැස්වීම් වාර්තාව දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොමැති බව | -එම- |
| (iv) | 2020 වර්ෂය සඳහා දියර නයිට්‍රජන් මිලදී ගැනීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු කල්වේලා ඇතිව ආරම්භ නොකිරීම හේතුවෙන් 2019 දෙසැම්බර් මස 21 වන දින රැස්වූ ප්‍රසම්පාදන කමිටුව 2019 වර්ෂයේ මිලදී ගැනීම් සඳහා වූ 2018 නොවැම්බර් 15 දිනැති ප්‍රසම්පාදන මණ්ඩල තීරණය 2020 පෙබරවාරි මස දක්වා නැවත ඇණවුම් කිරීමේ ප්‍රසම්පාදන ක්‍රමය යටතේ දීර්ඝ කර තිබුණි. ඒ අනුව 2020 ජනවාරි සහ පෙබරවාරි මාස සඳහා ලීටරයක් රු.74 බැගින් ලිටර් 41,404 ක් සඳහා රු.3,063,896 ක් ගෙවා මිලදී ගෙන තිබුණි. | පිළිගන්නා බව | -එම- |
| (v) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6 මාර්ගෝපදේශය යටතේ භාණ්ඩ සැපයීම් සඳහා නැවත ඇණවුම් කළ හැක්කේ මුල් සැපයුමෙන් පසු මිල අඩු වී නොතිබුණු බවට අස්ථිත්වය සහතික වන්නේ නම් පමණකි. එහෙත් 2020 වර්ෂයට ලංසු කැඳවීම 2020 ජනවාරි 03 දින සිට සිදු කෙරුණු අතර 2020 ජනවාරි | පිළිගන්නා බව | -එම- |

24 දින ලංසු විවෘත කෙරුණි. එහිදී එක් සැපයුම්කරුවෙකු විසින් දියර නයිට්‍රජන් ලීටර් එකක් රු.60.25 කට සැපයීමට ඉදිරිපත් වී තිබුණි. මේ අනුව නැවත ඇණවුම් කිරීමේ ක්‍රමය යටතේ මිලදී ගත් ලීටර් 41,404 ක් සඳහා දෙපාර්තමේන්තුවට ලීටරයකට රු.13.75 බැගින් රු.569,305 ක මුදලක් අහිමි වී තිබුණි.

**3.8 වත්කම් කළමනාකරණය**

**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>----------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------- | නිර්දේශය<br>------------ |
|---|---|---|---|
| (අ) | සීප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාලය සතු රජයේ නිවාස 04 ක් සංචාරක නිවාසයක් ඇතුළු ගොඩනැගිලි 09 ක් නිෂ්කාර්යයව පැවතුණි. මෙයින් ගොඩනැගිලි 05 ක් අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවති අතර 04 ක් කාර්යය මණ්ඩල පුරප්පාඩු නිසා භාවිතයෙන් තොරව පැවතුණි. | සියළු ගොඩනැගිලි අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට නියමිත බව | ගොඩනැගිලි අළුත්වැඩියා කර උපයෝජනයට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | සීප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාලයේ ප්‍රයෝජනය සඳහා රු.1,553,000 ක් වැය කර අලුත්වැඩියා කරන ලද බීජ රක්වනාගාර යන්ත්‍රය ක්‍රියාවිරහිත වීම හේතුවෙන් වසර 03 ක් පමණ කාලයක සිට භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි. | මෙහි සවිකර ඇති යන්ත්‍රයක පවතින කාර්මික දෝෂය නිවැරදි කොට සිසුන්ගේ පුහුණු අවශ්‍යතාවයන් යෙදෙන අවස්ථාව වන විට මෙම බීජ රක්වනාගාරය භාවිතයට ගැනීමට නියමිත බව . | පවතින සම්පත් උපරිම ලෙස භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුවීම. |
| (ඇ) | සීප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාලයෙන් සත්ත්ව පාලන අධ්‍යාන කටයුතු වෙනුවෙන් උපයෝගී කරගන්නා සතුන් 357 ක් රඳවා සිටින අතර 2019 වර්ෂය තුළදී සතුන්ගේ ආහාර අවශ්‍යතාවය වෙනුවෙන් රු.1,965,700 ක් වැය කර තිබුණද 2019 වර්ෂය තුළ කිසිදු අධ්‍යාන කටයුත්තක් සිදු කර නොතිබුණි. | පාඨමාලා නවීකරණය කිරීමේ අවශ්‍යතාවය මත හා රටේ පවතින වසංගත තත්ත්වය මත රජයේ බලධාරීන් ගෙන ඇති තීරණ අනුව සත්ත්ව පාලන ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීම අත්හිට වුවද පුහුණු මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාකර ඇති බව . | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සීප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාලය පිහිටි අක්කර 129 ක ඉඩම 1985 වසරේ සිට භාවිතා කරන නමුත් 2020 වර්ෂය වන විටත් දෙපාර්තමේන්තුවට පවරාගෙන නොතිබුණි. | ඉඩම්වල පවරා ගැනීමේ කටයුතු මේ වන විටද සිදු වෙමින් පවතින බව. | විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | කරඳගොල්ල කුකුල් පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටි ඉඩම අක්කර 25 ක් වන නමුත් එයින් අක්කර 06 ක පමණ භූමියක් නිසි භාවිතයෙන් තොරව පැවතුණි. | පිළිගන්නා බව. | පර්යේෂණ මධ්‍යස්ථානය සතු වත්කම්වලින් උපරිම ප්‍රයෝජන අත්කර දීමට කටයුතු කළ යුතු වීම. |
| (ඊ) | 2015 වර්ෂයේ එවකට පැවති තාරා කොටුව රු.1,562,000 ක් වැය කර ගව ගාලක් බවට පරිවර්තනය කර තිබුණු නමුත් එය 2020 ඔක්තෝබර් වන විටත් භාවිතයෙන් තොරව පැවතුණි. | පුහුණු ශ්‍රමිකයන් නොමැතිව අභිජනන ගොවිපළක් පවත්වා ගෙන යා නොහැකි අතර ශ්‍රමික අවශ්‍යතාවය ලද විගස මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන බව. | -එම- |

**3.9 විගණන විමසුම්වලට පිළිතුරු ලබානොදීම**

| විගණන නිරීක්ෂණය | දෙපාර්තමේන්තුවේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණකාධිපතිවරයාට අවශ්‍යවන පරිදි නිශ්චිත කාල සීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු විගණන විමසුම් 03 සඳහා පිළිතුරු ලබාදී නොතිබුණි. | ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව පිළිතුරු සැපයීමට කටයුතු කරන බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |

**3.10 කළමනාකරණ දූර්වලතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සත්ත්ව සෞඛ්‍ය අංශයට අයත් ගබඩාව 2020 ඔක්තෝබර් මස පරීක්ෂාවේදී වර්ග 24 කට අයත් භාණ්ඩ ඒකක 2462 ක් මිලදී ගෙන වසරකට වැඩි කාලයක්ද, වර්ග 82 කට අයත් භාණ්ඩ ඒකක 984 ක් මිලදී ගත් දින සිට වසර 02 කට වැඩි කාලයක්ද, වර්ග 10 කට අයත් ගබඩා භාණ්ඩ ඒකක 72 ක් ගබඩාවට ලැබුණ දින සිට වසර 5 ක් ගත වී තිබුණද ගබඩාවෙන් නිකුත් නොවී පැවතුණි. තවද වර්ග 24 කට අයත් ගබඩා භාණ්ඩ ඒකක 5,872 ක් කල් ඉකුත් වි තිබුණි. | රසායන ද්‍රව්‍ය අවසන් වී නැවත මිලදී ගැනීමට නැවත කාලයක් ගතවන බැවින් එම පොරොත්තු කාලය තුළ අදාල පරීක්ෂණ සිදුකර ගෙන යාමේ ගැටළු මතුවන බැවින් අතිරික්ත තොග පවත්වා ගෙන යනු ලබන බවත් කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් කල් ඉකුත් වීම් සිදු වූ බව | අවශ්‍යතාවය පදනම් කරගෙන වඩා තාත්ත්වික ලෙස ප්‍රසම්පාදන සැලැසුම සකස් කළ යුතු වීම. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළගාකර ගැනීම**

**-------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 ‘‘න්‍යාය පත්‍රය’’ පිළිබඳ ව දැනුවත් වී සිටියද එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සංධිස්ථානයන් ද ඉලක්ක මත ළඟා වීම මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | පසුගිය වසරේ රජයේ තිරසර සංවර්ධන අරමුණු වලට හා ඉලක්කයන්ට අනුව දෙපාර්තමේන්තුව විසින් දර්ශකයන් හඳුනාගැනීමට කටයුතු කර ඇති අතර ඒ අනුව පිළියෙල කරන ලද වාර්තාවේ පිටපතක් ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්කයන් පිළිබඳ දැනුවත් වී එම අරමුණු ළඟාකර ගැනීමට සැලැසුම් කළ යුතු වීම. |
| (ආ) | තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන් හඳුනා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් සහභාගීත්ව ප්‍රවේශයක් නිරූපණය නොකෙරුණි. | පසුගිය වසරේ රජයේ තිරසර සංවර්ධන අරමුණුවලට හා ඉලක්කයන්ට අනුව දෙපාර්තමේන්තුව විසින් දර්ශකයන් හඳුනාගැනීමට කටයුතු කර ඇති අතර ඒ අනුව පිළියෙල කරන ලද වාර්තාවේ පිටපතක් ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | ආයතනය විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්හි ළඟා වීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පසුගිය වසරේ රජයේ තිරසර සංවර්ධන අරමුණුවලට හා ඉලක්කයන්ට අනුව දෙපාර්තමේන්තුව විසින් දර්ශකයන් හඳුනාගැනීමට කටයුතු කර ඇති අතර ඒ අනුව පිළියෙල කරන ලද වාර්තාවේ පිටපතක් ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | -එම- |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) (i) | දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම තුළ තනතුරු 22 ක පුරප්පාඩු 63 ක් පැවති අතර එම පුරප්පාඩු අතර අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 4 ක්ද, ප්‍රධාන විද්‍යාඥ තනතුරු 6 ක්ද, පශු විමර්ශන නිලධාරි තනතුරු 13 ක්ද විය. | පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා අමාත්‍යාංශය වෙත දන්වා ඇති බව. | දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය පදනම් කරගෙන පුරප්පාඩු පිරවීමට කටයුතු කළයුතු වීම. |
| (ii) | දෙපාර්තමේන්තුව සඳහා අනුමත කර තිබුණේ පශු වෛද්‍ය නිලධාරී තනතුරු 61 ක් පමණක් වුවද 70 ක් අනුයුක්ත කර තිබූ බැවින් පශු වෛද්‍යවරු 9 ක් අතිරික්තව පැවතුණි. | පශු වෛද්‍ය නිලධාරීන් 07 ක් සඳහා සත්ත්ව නිරෝධායන නිලධාරී තනතුරු නාමයද පශු වෛද්‍ය නිලධාරීන් 10 ක් සඳහා පශු විමර්ශන නිලධාරි නාමයද ලබාදීමට ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව. | අනුමත කාර්යය මණ්ඩලය තුළ කටයුතු කළයුතු වීම. |
| (iii) | දෙපාර්තමේන්තුව සඳහා සංඛ්‍යා ලේඛනඥ තනතුරක් අනුමත කර නොමැති නමුත් එක් නිලධාරියෙකු අනුයුක්ත කර තිබුණි. | එම තනතුර දෙපාර්තමේන්තුව වෙත අනුමත කර ගැනීම සඳහා ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. | -එම- |
| (iv) | ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 103 ක් පැවති බැවින් ක්ෂේත්‍ර කාර්යයන් කරගෙන යාමේදී අපහසුතා පැන නැගී තිබුණි. | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2020 අනුව සියළුම බඳවා ගැනීම් නැවත දැනුම් දෙන තුරු අත්හිටුවා ඇති බව. | දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය පදනම් කරගෙන පුරප්පාඩු පිරවිය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2013 අප්‍රේල් 05 දිනැති අංක PSC/EST/3/4/2/2012 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලිපියෙන් අනුමත කර තිබුණු ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ ස්ථාන මාරු පටිපාටිය අනුව වසර 5 කට වැඩි කාලයක් එකම සේවා ස්ථානයක සේවය කර ඇති සේවකයින් ස්ථාන මාරු කිරීමට අනිවාර්යයෙන්ම යටත් විය යුතු වුවද වසර 11 සිට වසර 30 දක්වා එකම ස්ථානයේ සේවයකළ සේවකයන් 16 ක් සම්බන්ධයෙන් එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි. | ඉදිරියේදී ස්ථාන මාරුවීම් ලබාගැනීමට කටයුතු කරන බව. | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පටිපාටිය අනුගමනය කළ යුතු වීම. |
| (ඇ) | රාජ්‍ය අංශය තුළ මානව සම්පත් සංවර්ධනයට අදාළ 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් පරිදි කාර්යසාධන ඇගයීම් පත්‍රිකා භාවිතය, කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම, මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම සහ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සඳහා කාර්ය මණ්ඩලය යොදවාගන්නා ආකාරය පිළිබඳ සැලැස්මක් සකස් කිරීම යන අවශ්‍යතා කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | අංශ මට්ටමින් සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධි විධාන අනුව කටයුතු කළ යුතු වීම. |